# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1852/41 - 2014 මාර්තු මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2014.03.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/22/23/2006.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.07.28 දිනැති හා අංක 1664/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.07.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් මත්තෙගොඩ, බණ්ඩාරනායක පුර නො. 193/49/1 හි පදිංචි ඩබ්.ඩබ්. පෙරේරා මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කිරුල පාර, නො. 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.12.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,<br>
කම්කරු කොමසාරිස්.

2014 පෙබරවාරි මස 18 වැනි දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.

යොමු අංකය : අයි.ආර්./22/23/2006

කාර්මික අධිකරණයේදීය

එක් පාර්ශ්වයක් වශයෙන්

ඩබ්. ඩබ්. පෙරේරා මයා,<br>
නො. 193/49/1,<br>
බණ්ඩාරනායක පුර,<br>
මත්තෙගොඩ.

අනෙක් පාර්ශවය වශයෙන්

නඩු අංකය : A/3337

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,<br>
නො. 200, කිරුල පාර,<br>
කොළඹ 05.

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය, 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කම්කරු ආරවුල් පණතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව, ඉහත පාර්ශ්වයන් අතර පවත්නා ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2010.07.23 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර පවතින කාර්මික ආරවුල මෙසේය :-

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ III – A ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් සේවය කර 2006.08.11 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එහි සේවයෙන් විශ්‍රාම ලැබූ ඩබ්. ඩබ්. පෙරේරා මහතා 2005.10.19 වැනි දින සිට බලපවත්නා පරිදි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයකු වශයෙන් සලකා ඒ අනුව නියමිත වැටුප් තලයේ පිහිටුවීමට හිමිකම් ලබන්නේ නම්, ඩබ්. ඩබ්. පෙරේරා මහතාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ."

මෙම ආරවුලට අදාළ පාර්ශවයන් විසින් ඔවුන්ගේ ප්‍රකාශ බේරුම්කරුට ඉදිරිපත් කර පසුව එකිනෙකාගේ ප්‍රකාශ හුවමාරු කිරීමෙන් පසු විමසීම සඳහා පළමුවරට 2010.11.25 වෙනි දින කැඳවූවත්, දෙපාර්ශවයේම නීතිඥවරු නොපැමිණි බැවින් 2011.01.27 වෙනි දින කැඳවූවත් එදිනද පැමිණිලිලේ නීතිඥ මහතාට පැමිණීමට නොහැකි බව දැන්වූවත්, දෙපාර්ශවය අතර, සමථයක් තිබේ දැයි සොයා බලන ලෙස වගඋත්තරකාර පාර්ශවයට දැනුම් දුන්නත්,


1 A – G 19168 — 75 (2014/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2011.04.29 වෙනි දින විභාගයට කැඳවූ අවස්ථාවේ වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥවරිය දන්වා සිටියේ සමථයක් නොමැති බැවින් විභාගය පවත්වා ගෙන යන ලෙසය. එදිනද පෙත්සම්කරුගේ නීතිඥ මහතා නොමැති බැවින් 2011.08.04 වෙනි දින විභාගය ආරම්භ කරන ලදී.

ඉල්ලුම්කරු වෙනුවෙන් නීතිඥ ලක්ෂ්මන් බුලත්සිංහල මහතා පෙනී සිටි අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් නීතිඥ නිමාෂා අයන්ති මහත්මිය සමග රජයේ නීතිඥ තවීෂා ජයසිංහ මෙනෙවිය පෙනී සිටින ලදී.

ඉල්ලුම්කරු A/01 සිට A/10 දක්වා වූ ලේඛන ලකුණු කර දීර්ඝ ලෙස සාක්ෂි දෙමින් 2005.10.19 වන දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්ත වූ පසු වැටුපේ ඇති විෂමතාවය පිළිබඳ එනම්, සමාන, මට්ටමේ සිටින (III A ශ්‍රේණියේ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ නිලධාරියෙකුගේ වැටුප හා ඉල්ලුම්කරුගේ වැටුපේ වෙනසක් ඇති බව ඉහළ නිලධාරීන්ට වාචිකව දන්වා ඇති බවත්, ඉතා ඉක්මණින් යථා කාලයේදී මෙම වැටුප් විෂමතාව නිවැරදි කරන බවටත්, දැන්වූ බවට සාක්ෂි දී ඇත. මේ සම්බන්ධව 2006.03.08 වන දින කම්කරු කොමසාරිස්තුමාටද ලිඛිතව පැමිණිලි කරන ලද බව වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥවරියගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දී ඇත.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ප්‍රාදේශීය මුදල් කළමනාකරු ජයවික්‍රම ආරච්චිගේ විනී නැමති අය R/01 සහ R/02 යන ලේඛන ඉදිරිපත් කරමින් සාක්ෂි දෙන ලදී.

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි, ලේඛන හා ලිඛිත දේශන අනුව තුලානාත්මකව බැලීමේදී පහත සඳහන් කරුණු අනාවරණය වෙයි.

01. ඉල්ලුම්කරුගේ සහ සමාන ශ්‍රේණියේ සේවය කල සමහරුන්ගේ වේතනය (මධ්‍යම ගමනාගමන මණ්ඩල ප්‍රධාන කාර්යාලයේ) අතර විෂමතාවයක් ඇති බව.

02. 2005.10.19 වන දින ගැසට් නිවේදනයක් මගින් 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය 09 ක් සහ මධ්‍යම ගමනාගමන මණ්ඩලය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය බවට පත්වීම.

03. ඉල්ලුම්කරු වැටුප් විෂමතාවය පෙන්වා දුන්නත් ඔහු 2006.08.10 වන දින සේවයෙන් විශ්‍රාම යන තෙක් එම විෂමතාවය වෙනස් කිරීමට කටයුතු නොකිරීම.

04. 2008 අංක 02 දරන චක්‍ර ලේඛනය මඟින් වැටුප් විෂමතාව සම කර තිබීම.

2008 අංක 02 දරන චක්‍ර ලේඛනය මගින් පැහැදිලිව දක්වා ඇත්තේ "2008.01.01 වෙනි දින සිට බලපවත්වන පරිදි එකී චක්‍ර ලේඛනයේ සඳහන් පඩි ක්‍රමය පෙර පොකුරු බස් සමාගම්වලට හා පෙර ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයට අයත් වූ සියළුම සේවකයින්ට සමාන කිරීමට තීරණය කර ඇත." යනුවෙනි.

"2005 අංක 04 දරන චක්‍ර ලේඛනයේ 02 : 02 ඡේදයේ සඳහන් 50% ඉතිරි හිමිකම් ගෙවීම් ක්‍රියාත්මක කළ යුතු දිනය 2006.01.01 වෙනි දින වශයෙන් සඳහන් වුවද, එය ක්‍රියාත්මක කළ යුත්තේ 2008.01.01 දින වේ." යනුවෙන් සඳහන් කර ඒ අනුව i වන ශ්‍රේණියේ සිට iv වන ශ්‍රේණිය දක්වා ශ්‍රී ලංගම සේවකයින්ට අදාළ වැටුප් පියවර අනුව ගෙවීම් කළ යුතු යැයිද සඳහන් කර ඇත.

2008 අංක 02 දරන චක්‍ර ලේඛනය අනුව 2005 ඔක්තෝබර් මස 18 වැනි දින සිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලෙස සියළු සේවකයින් පත් වීමෙන් පසු iii "අ" වන ශ්‍රේණියේ වැටුප් විෂමතා සහිත 6000 ක් වූ සේවකයින් කිසිවකුට වැටුප් සකස් කර ඇති බවක් ඉල්ලුම්කරු පෙන්වා දී නැත. එසේ හිඟ වැටුප් කිසිවකුට සකස් කර නැත. 2008 අංක 02 දරන චක්‍ර ලේඛනයේ හිඟ වැටුප් සකස් කිරීමක් පිළිබඳව දක්වාද නැත.

ඉල්ලුම්කරු 2005.10.19 වන දින සිට 2006.08.10 වන දින විශ්‍රාම යන තෙක් වැටුප් විෂමතාවයට භාජනය වෙමින් සිටි බව තහවුරු වුවත්, 2008 අංක 02 දරන චක්‍ර ලේඛනය අනුව ඉල්ලුම්කරුගේ වැටුප් විෂමතාව පමණක් නිවැරදි කළ යුතු යැයි තීරණය කල නොහැකිය.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බව මාගේ නිගමනයයි.

ආර්. එස්. ආරියප්පෙරුම,
බේරුම්කරු.

2013 දෙසැම්බර් මස 04 වෙනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

03 - 539

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.